සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2020
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |


**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) **I** ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු **II** පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.




(01) වැවක ප්‍රධාන අංග ඇතුළත් රූප සටහනක් ඉහත දැක්වේ. එහි A,B හා C ලෙස දැක්වෙන්නේ,

(1) පිටවාන, වැව් බැම්ම හා වාරි ඇළ ය.

(2) පිටවාන, බිසෝකොටුව හා වාරි ඇළ ය.

(3) වාරි ඇළ, බිසෝකොටුව හා පිටවාන ය.

(4) වාරි ඇළ, පිටවාන හා ගඟ ය.

(02) යම් ප්‍රදේශයක වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාව කෙරෙහි බලපාන ප්‍රධාන කාළගුණික සාධක වන්නේ,

(1) උච්චත්වය හා ආලෝකය ය.   (2) ආලෝකය හා සුළඟ ය.

(3) උෂ්ණත්වය හා සුළඟ ය.   (4) ආලෝකය හා උෂ්ණත්වය ය.

(03) බෝග වගාවට බලපාන කාළගුණික සාධක දෙකක් වන, ආලෝක තීව්‍රතාව හා ආලෝකය පවතින කාලසීමාව, මනිනු ලබන උපකරණ වන්නේ පිළිවෙලින්,

(1) සූර්ය දීප්තමානය හා සූර්ය විකිරණමානය ය.

(2) සූර්ය විකිරණමානය හා සූර්ය දීප්තමානය ය.

(3) සූර්ය විකිරණමානය හා ස්ලින්ග් ආර්ද්‍රතාමානය ය.

(4) සූර්ය විකිරණමානය හා අලෝක මීටරය ය.

(04) ප්‍රභා - අවධි සංවේදිතාව අනුව බෝග වගා කිරීමට සුදුසු කාල වකවානු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - දිගු දින ශාක මහ කන්නයේ වගා කිරීමට සුදුසු ය.

B - කෙටි දින ශාක මහ කන්නයේ වගා කිරීමට සුදුසු ය.

C - දින උදාසීන ශාක ඕනෑම කන්නයක වගා කළ හැකි ය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා C යන සියලු ම ප්‍රකාශ නිවැරදි ය.

(05) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ගම්පහ, කොළඹ හා කළුතර යන ප්‍රදේශවල බහුලව පැතිර ඇති පස් කාණ්ඩය වන්නේ,

(1) රතු දුඹුරු පස ය. (2) දියළු පස ය.
(3) රතු කහ ලැටසෝල් පස ය. (4) රතු කහ පොඩ්සොලික් පස ය.

(06) පසේ අඩංගු ඛනිජ වර්ග අනුව පාංශු වර්ණය වෙනස් වේ. ඒ අනුව කැල්සියම් ලවණ වැඩිපුර අඩංගු පසක්,

(1) රතු පැහැයට හුරු ය. (2) සුදු පැහැයට හුරු ය.
(3) අලු පැහැයට හුරු ය. (4) කහ පැහැයට හුරු ය.

(07) පාංශු පැතිකඩෙහි ' විශෝධන කලාපය' ලෙස හැඳින්වෙන්නේ එහි,

(1) A කලාපය ය. (2) B කලාපය ය.
(3) A හා B කලාප ය. (4) A, B හා C යන කලාප ය.


(08) වැහි බිංදු පස මතුපිටට වැටී, මතුපිට ඇති පස තුනී ස්ථරයක් ලෙස සේදී ඉවත් වී යාම,

(1) විසිරි ඛාදනය ලෙස හැඳින්වේ. (2) ස්ථරීය ඛාදනය ලෙස හැඳින්වේ.
(3) ඇඟිලි ඛාදනය ලෙස හැඳින්වේ. (4) ඇලි ඛාදනය ලෙස හැඳින්වේ.

(09) බෝගයේ වයස අනුව බෝග වර්ගීකරණයේ දී, වාර්ෂික බෝග පමණක් අයත්වන බෝග කාණ්ඩය සහිත පිළිතුර තෝරන්න.

(1) කව්පි, මෑ, කරවිල, ගම්මිරිස්. (2) මුං, මෑ, කරවිල, බණ්ඩක්කා.
(3) රබර්, කව්පි, මිරිස්, පතෝල. (4) මිරිස්, තක්කාලි, දෙළුම්, ගම්මිරිස්.

(10)



(A)



(B)

ඉහත දක්වා ඇති A හා B උපකරණ බිම් සැකසීමේ දී ඉටු කරන කාර්යයක් වන්නේ පිළිවෙලින්,

(1) පස පෙරළීම හා පස් කැට පොඩි කිරීම ය.

(2) සියුම් ලෙස පස සැකසීම හා පස් පිඩැලි කැපීම ය.

(3) පස් පිඩැලි කැපීම හා පස් පෙරළීම ය.


(4) පස් කැට පොඩි කිරීම හා පස මට්ටම් කිරීම ය.

(11) බීජ සංස්ථාපනයේ දි කුඩා බීජ පේළි සහිතව හෝ රහිතව වපුරනු ලැබේ. එවැනි බීජ කාණ්ඩයකි,

(1) බණ්ඩක්කා, රාබු, වට්ටක්කා හා මිරිස්. (2) තල, කුරක්කන්, රාබු හා කැරට්.

(3) වී, තල, කුරක්කන්, හා තක්කාලි. (4) අබ, තල, බඩඉරිගු හා සලාද.

(12) පහත රූපයෙන් දැක්වෙනුයේ, උස් වූ පාත්තියක මතුපිට පෙනුම වේ. එහි A හා B යනු පිළිවෙළින්,




(1) කාබනික පොහොර හා මතුපිට පස් ය. (2) මතුපිට පස් හා කාබනික පොහොර ය.

(3) තවාන් මිශ්‍රණය හා පිහිටි බිමෙහි පස් ය. (4) මතුපිට පස් හා තවාන් මිශ්‍රණය ය.

(13) වියළි කලාපයේ, වැලිමය වයනයක් සහිත ක්ෂේත්‍රයක වගා කරන ලද පළතුරු බෝග සඳහා වඩාත්ම සුදුසු ජලසම්පාදන ක්‍රමය වන්නේ,

(1) වළලු ජලසම්පාදනය යි. (2) විසිරි ජලසම්පාදනය යි.

(3) තීරු ජලසම්පාදනය යි. (4) බිංදු ජලසම්පාදනය යි.

(14) වගා භූමියකට කාබනික පොහොර යෙදීමෙන්, පසේ සිදුවන වෙනස් වීම් පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පසේ අහිතකර ක්ෂුද්‍රජීවී ගහණය වැඩි වේ.

(2) පසේ වයනය වැඩි දියුණු වේ.

(3) කාබනික පොහොර දිගු කාලයක් තිස්සේ පසට පෝෂක නිදහස් කරයි.

(4) කාබනික පොහොර, ප්‍රධාන ශාක පෝෂක කිහිපයක් පමණක් පසට නිදහස් කරයි.

(15) රසායනික පොහොර හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ප්‍රධාන පෝෂක තුනම අඩංගු කර සාදන පොහොර පූර්ණ පොහොර මිශ්‍රණ වේ.

B - ප්‍රධාන පෝෂක තුනෙන් දෙකක් පමණක් අඩංගු පොහොර අර්ධ පොහොර මිශ්‍රණ වේ.

C - ප්‍රධාන ශාක පෝෂක තුනෙන් එකක් පමණක් අඩංගු පොහොර අමිශ්‍ර පොහොර වේ.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි (2) A හා C පමණි

(3) B හා C පමණි (4) A, B, හා C යන සියල්ල ම ය.

(16) ප්‍රරෝහණය වන බීජ හා තවාන් පැළවලට බහුලවම වැළඳිය හැකි රෝගය,

(1) පත්‍ර විචිත්‍ර රෝගය ය. (2) ඇන්ත්‍රැක්නෝස් ය.

(3) හිටු මැරීම ය. (4) දියමලන් කෑම ය.

(17) කෘමින්ගේ ජීවන චක්‍රයේ, කීට අවධිය පමණක් බෝගවලට හානි කරන කෘමි පළිබෝධකයෙකු වන්නේ,

(1) ගොයම් මකුණා ය. (2) එපිලැක්නා කුරුමිණියා ය.

(3) සුදු මැස්සා ය. (4) ඉල්මැස්සා ය.

(18) වල් නාශක හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- වල්නාශක යෙදිය යුතු අවස්ථාව අනුව ප්‍රධාන ආකාර දෙකකි.

B - සියල්ල නසන වල් නාශක යොදනුයේ බෝගය සිටුවීමට පෙර බිම් සැකසීමේ දී ය.

C - සංස්ථානික වල් නාශක යෙදූවිට ශාකයේ ස්පර්ශ වී ශාක පටක විනාශ වේ.

මෙම ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A පමණි. (2) A හා B පමණි.

(3) C පමණි. (4) A , B හා C යන සියලුම ප්‍රකාශ නිවැරදි ය.

(19) රෝග ත්‍රිකෝණයේ රෝගයක් වැළඳීමට සම්පූර්ණ විය යුතු සාධක තුනක් දක්වා ඇත. ඒවා නම්,

(1) රෝග කාරකයාට හිතකර පරිසරය , ධාරක ශාකය සහ රෝග පාලනය වේ.

(2) රෝග පාලනය , ධාරක ශාකය සහ ශාකයට අහිතකර පරිසරය වේ.

(3) රෝග කාරකයාට හිතකර පරිසරය, ධාරක ශාකය සහ රෝග කාරකයා වේ.

(4) ධාරක ශාකය, රෝග කාරකයා සහ රෝග පාලනය වේ.

(20) බිත්තර වීවල තිබිය යුතු අවම ප්‍රරෝහණ ප්‍රතිශත අගය,

(1) 90% කි. (2) 70% කි. (3) 75%කි. (4) 85% කි.

(21) ඩැපොග් තවානක සිටුවන ලද වී බීජ පැළ දින 10 - 12 වයසේ දී ක්ෂේත්‍රයේ සිටුවීමට වඩා සුදුසු බව නිර්දේශ කර ඇත. එයට හේතුව,

(1) වී බීජයේ සංචිත ආහාර දින 12 කට පමණක් ප්‍රමාණවත් වීම ය.

(2) එම බීජ පැළ දින 12 කට පසු මුල් ඇදී දික්වීම නිසා මුල් කැඩීමට ඉඩ ඇති නිසා ය.

(3) වී බීජයේ සංචිත ආහාර දින 14 කට පමණක් ප්‍රමාණවත් වීම ය.

(4) එම බීජ පැළ දින 12 කට පසු යන්ත්‍ර මගින් සිටුවීමට අපහසු නිසා ය.

(22) රෛසෝමය හා ස්කන්ධ ආකන්ද යන ස්වභාවික වර්ධක ප්‍රචාරක ව්‍යුහ මගින්, ප්‍රචාරණය කළ හැකි ශාක වන්නේ පිළිවෙලින්,

(1) කහ හා ඉගුරු ය. (2) රතුළුණු හා කෙසෙල් ය.

(3) බතල හා අර්තාපල් ය. (4) කහ හා අර්තාපල් ය.

(23) වර්ධක ප්‍රචාරණය මගින් ලබා ගන්නා ශාකවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,


(1) දෙමුහුම් දිරිය සහිත ශාක ලබා ගත හැකි වීම ය.

(2) මව් ශාකයේ ලක්ෂණවලට වෙනස් විවිධ ලක්ෂණ සහිත පැළ ලබා ගත හැකි වීම ය.

(3) මව් ශාකයේ ලක්ෂණවලට සමාන පැළ ලබා ගත හැකි වීම ය.

(4) එම ශාකවලින් වැඩි කාලයක් අස්වනු ලබා ගත හැකි වීම ය.

(24)



බීජයක බීජ පත්‍ර ගණන අනුව බීජ ආකාර දෙකකි. ඉන් එක් ආකාරයක බීජයක දික්කඩක් ඉහත රූපයේ දැක්වේ. මෙම ආකාරයට උදාහරණ දක්වා ඇති පිළිතුර තෝරා දක්වන්න.

(1) වට්ටක්කා, මුං, පුවක්, රඹුටන්

(2) පොල්, බඩඉරිඟු, කොස්, බෝංචි

(3) කරවිල, අඹ, පොල්, කඩල

(4) වට්ටක්කා, අඹ, කොස්, මෑ

(25) වායව අතු බැඳීම සිදු කර, සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බෝග කාණ්ඩයකි,

(1) පේර, කොස් හා අඹ.

(2) දොඩම්, ජම්බු හා අඹ.

(3) දෙහි, දෙළුම් හා ජම්බු.

(4) දූරියන්, සමන්පිච්ච හා උගුරැස්ස.

(26) ඒකීය සූර්ය ප්‍රචාරකයක් යනු,

(1) අඩු උෂ්ණත්වයක් හා අඩු ආර්ද්‍රතාවයක් වර්ධක කොටස්වලට ලැබෙන සේ සැකසූ ව්‍යුහයකි.

(2) වැඩි ආලෝක තීව්‍රතාවයක්, වර්ධක කොටස්වලට ලැබෙන සේ සැකසූ ව්‍යුහයකි.

(3) එක් ශාක කැබැල්ලක් තනිව මුල් අද්දවා ගැනීමට සැකසූ ව්‍යුහයකි.

(4) ශාක කැබලි සමූහයක්, එකවර මුල් අද්දවා ගැනීමට සැකසූ ව්‍යුහයකි.

(27) ඝන මාධ්‍යය තුළ සිදුකරන නිර්පාංශු වගා ක්‍රම අතරින් , සිරස් මලුවල වගාව සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,

(1) බුෂිටා මෑ, කව්පි වැනි රනිල බෝග ය.

(2) වැටකොළු හා කරවිල වැනි වැල් බෝග ය.

(3) බතල හා අර්තාපල් වැනි අල බෝග ය.

(4) ගොටුකොළ හා කංකුං වැනි කොළ එළවළු ය.

(28) සංරක්ෂණ ගොවිතැනේ දී බෑවුම් භූමි සඳහා සේර හා සැවැන්දරා වැනි බෝග වගා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) පාංශු ඛාදනය වැළැක්වීම ය.

(2) පසට නයිට්‍රජන් පෝෂකය ලබා දීම ය.

(3) පාංශු තෙතමනය ආරක්ෂා කිරීම ය.

(4) පසේ ජලවහනය දියුණු කිරීම ය.

(29) පසු අස්වනු හානි අවම කිරීම සඳහා උපරිම මේරීමේ අවස්ථාවට පෙර අස්වනු නෙලීම සිදු කළ යුතු බෝගය වන්නේ,

(1) දොඩම් ය. (2) අන්නාසි ය. (3) කෙසෙල් ය. (4) දෙහි ය.

(30) යකඩ බහුලව අඩංගුවන ආහාර කාණ්ඩය වන්නේ,

(1) දොඩම් කුලයේ පලතුරු හා ධාන්‍ය බෝග ය.

(2) රතු මස් වර්ග හා තද කොළ පැහැ එළවළු ය.

(3) මුහුදු මාළු වර්ග හා අයඩින් අඩංගු ලුණු ය.

(4) රතු මස් වර්ග හා කිරි ආහාර වර්ග ය.

(31) ඉතා ඉක්මණින් නරක්වන හා ආහාර විෂවීම් තත්ත්ව බහුලව ඇති කරන ආහාර වර්ග හඳුන්වන්නේ,

(1) අධි අවදානම් ආහාර ලෙස ය. (2) කල් ඉකුත් වූ ආහාර ලෙස ය.

(3) පරිරක්ෂිත ආහාර ලෙස ය. (4) අවම සැකසූ ආහාර ලෙස ය.

(32) ශාක තෙල් වර්ග නිස්සාරණයේ අතුරුඵලයක් වන පුන්නක්කු ලාභදායි සත්ත්ව ආහාරයක් ලෙස බහුලව යොදා ගනු ලැබේ. මෙම සත්ත්ව ආහාරය,

(1) තෙත් දළ ආහාරය කි. (2) වියළි දළ ආහාරය කි.

(3) සාන්ද්‍ර ආහාරය කි. (4 දළ ආහාරය කි.

(33) අධික ලෙස කිරි නිෂ්පාදනය කරන දෙනකට බහුලව වැළඳිය හැකි ඌනතා රෝගය වන්නේ,

(1) කිණිතුලු උණ ය. (2) බඩ පිපුම ය. (3) බුරුළු ප්‍රදාහය. (4) කිරි උණ ය.

(34) ගව පාලනයේ දී ගව පැටවුන්ගෙන් කිරි වැරීම සිදු කළ යුතු අවස්ථාව වන්නේ,

(1) ගව පැටවා ඉපදී මාස 6ක් ගත වු පසුව ය.

(2) ගව පැටවා ඉපදී මාස 2-3 ක් ගත වු පසුව ය.

(3) ගව පැටවා ඉපදී මාසයක් ගත වු පසුව ය.

(4) ගව පැටවා මවගේ කිරි ප්‍රතික්ෂේප කරන අවස්ථාවේ දී ය.

(35) බිත්තර සඳහා කිකිළියන් ඇති කිරීමේ දී බෲඩර් අවධිය ලෙස සලකන කාලය වන්නේ,

(1) දිනක් වයසේ සිට සති දෙකක් වනතුරු කාලය යි.

(2) දිනක් වයසේ සිට සති තුනක් වනතුරු කාලය යි.

(3) දිනක් වයසේ සිට සතියක් වනතුරු කාලය යි.

(4) දිනක් වයසේ සිට මාසයක් වනතුරු කාලය යි.

(36) ආර්ථික වශයෙන් විශාල බලපෑමක් සිදුකරන, කුකුළන්ට වැළඳෙන බැක්ටීරියා රෝගය වන්නේ,

(1) කොක්සිඩියෝසිස් ය. (2) රානිකට් ය.

(3) පුල්ලෝරම් ය. (4) කුරුළු උණ ය.

(37) ආහාර පරිරක්ෂණය කිරීමේ ප්‍රධාන අරමුණ නම්,

(1) ආහාර නරක් වීම හා අපතේයාම අවම කිරීම ය.

(2) ආහාරවලට වැඩි ඉල්ලුමක් ඇති කිරීම ය.

(3) ආහාරවල ගුණාත්මක බව ආරක්ෂා කිරීම ය.

(4) ආහාරවල ප්‍රමාණාත්මක බව ආරක්ෂා කිරිම ය.

(38) ආහාර පරීක්ෂණ ක්‍රමයක්වන පැස්ටරීකරණයේ එක් ආකාරයක් වන වැඩි උෂ්ණත්ව කෙටි කාල ක්‍රමයේදී (HTST),

(1) ආහාරය 72°C උෂ්ණත්වයේ තත්පර 15 ක කාලයක් තබා ක්ෂණිකව 10°C දක්වා සිසිල් කරනු ලැබේ.

(2) ආහාරය 62°C උෂ්ණත්වයේ මිනිත්තු 30 ක කාලයක් තබා ක්ෂණිකව 10°C දක්වා සිසිල් කරනු ලැබේ.

(3) ආහාරය 100°C උෂ්ණත්වයේ මිනිත්තු 15 ක කාලයක් තබා ක්ෂණිකව 5°C දක්වා සිසිල් කරනු ලැබේ.

(4) ආහාරය 72°C උෂ්නත්වයේ මිනිත්තු 30 ක කාලයක් තබා ක්ෂණිකව 5°C දක්වා සිසිල් කරනු ලැබේ.

(39) ආහාර ඇසුරුම් කිරීමේ දී ආලෝකය මගින් ආහාරයට සිදුවන හානි වැළැක්වීමට වඩාත් සුදුසු ඇසුරුම් ද්‍රව්‍යයක් වන්නේ,

(1) කෙසෙල් ශාක පත්‍ර ය. (2) ටෙට්‍රා පැක් ඇසුරුම ය.

(3) අඳුරු පැහැති වීදුරු ය. (4) රැලි සහිත කාඩ්බෝඩ් ඇසුරුම් ය.

(40) මෙරට නිෂ්පාදනය කරන ලද ආහාරයක් විදේශිය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂකයකු විසින් ලබා ගත යුතු ප්‍රමිති සහතිකය වන්නේ,

(1) SLS සහතිකය යි.

(2) ISO සහතිකය යි.

(3) GAP සහතිකය යි.

(4) GMP සහතිකය යි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- **පළමු ප්‍රශ්නය** හා **තවත් ප්‍රශ්න හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(01) වැඩිවන ජනගහනය හේතුවෙන්, අනාගතයේ දී ඇතිවිය හැකි, අපේක්ෂිත ආහාර හිඟය සඳහා විසඳුමක් ලෙස ශ්‍රී ලංකාවේ ද විවිධ වැඩසටහන් ක්‍රියත්මක වේ. ඒ අනුව ජාතික ආහාර නිෂ්පාදන වැඩපිළිවෙල යටතේ ජනතාව අතර ගෙවතු වගාව ජනප්‍රිය කිරීමේ අරමුණින් විවිධ පියවර ගෙන ඇත.

(I) ගෙවතු වගාවක් පවත්වාගෙන යෑමෙන් පවුල් ඒකකයකට ලබාගත හැකි ප්‍රායෝජන දෙකක් සඳහන් කරන්න.

(II) වගාවක් ආරම්භ කිරීමට ප්‍රථම පස පරීක්ෂා කිරීමෙන් හඳුනා ගත හැකි පසේ භෞතික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(III) ගොවි මහතෙකු තම ගොවිපළහි ශෂ්‍යමාරු ගොවිතැන් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් බෝග තෝරා ගන්නා ලදී. එම බෝග අයත්වන ශාක කුල නම් කරන්න.

(a) බඩඉරිඟු (b) මෑ
(c) කරවිල (d) බතල

(IV) ශෂ්‍ය මාරු ගොවිතැන් ක්‍රමයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(V) කරවිල වගාවේ බහුලව දැකිය හැකි ඵලවලට හානි කරන පළිබෝධකයකු නම් කර, එම කෘමියා පාලනය කළ හැකි පරිසර හිතකාමී පළිබෝධ පාලන ක්‍රමයක් නම් කරන්න.

(VI) බඩඉරිඟු වගාවේ අතුරුයත් ගෑමේ කටයුතු සඳහා භාවිත කළ හැකි කෘෂි උපකරණ දෙකක් සඳහන් කරන්න.

(VII) මෙම ගොවිපොළහි කොම්පොස්ට් නිෂ්පාදනය සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය හතරක් ලියන්න.

(VIII) කරවිල අස්වැන්න වෙළෙඳපොළට ප්‍රවාහනයේ දී ඇතිවන පසු අස්වනු හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(IX) මුකුණුවැන්න පලා වගාවක් පවත්වාගෙන යන ගොවියෙකුට තම නිෂ්පාදනය වෙළඳපොලට ඉදිරිපත් කිරීමේ දී වැඩි මිලක් ලබා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(X) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා රජය විසින් ගොවීන් දිරිගන්වන ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 X 10 = 20)

(02) දේශගුණික සාධක මෙන්ම, පාංශු සාධක මනාව කළමනාකරණය කිරීමෙන් ප්‍රශස්ත බෝග වර්ධනයක් හා ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි ය.

(I) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න.

(b) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණය බෝග වගා කිරීමේ දී වැදගත්වන ආකාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(II) (a) පාෂාණ ජීර්ණය සඳහා බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න.

(b) බෝග වගා කිරීමේ දී ශාක භාවිත කරන ආකාරය අනුව පාංශු ඛාදනය අවම කර ගත හැකි ය. එවැනි ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(III) (a) බෝග වර්ධනය සඳහා භූමියක තිබිය යුතු ප්‍රශස්ත තෙතමන මට්ටම නම් කරන්න.

(b) ගොඩ බෝග වගා භූමියක, තද වූ පසක වාතනය දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(03) වර්ෂාව ප්‍රමාණවත් නොවනවිට ජලසම්පාදනය මෙන්ම, අතිරික්ත ජලය කේෂ්ත්‍රයේ ඇති විට ජලවහනය ද, බෝග වගාවේ දී ඉතා වැදගත් වේ.

(I) (a) බෝග වගාවට ජලය වැදගත්වන ආකාර දෙකක් සඳහන් කරන්න.

(b) පෘෂ්ඨීය ජලසම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු03)

(II) (a) ගොඩ බෝග වගා ක්ෂෙත්‍රයක යහපත් ජලවහනයක් පවත්වා ගැනීමෙන් ඇතිවන වාසි දෙකක් සඳහන් කරන්න.

(b) භූගත ජලවහන ක්‍රමයක් නම් කරන්න (ලකුණු 03)

(III) (a) බෝගවලට යොදන ජලය සමඟ ජලයේ දියවන පොහොර ද යෙදිය හැකි ජලසම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

(b) පසට යොදන පොහොර, බෝග විසින් ප්‍රයෝජනට ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(04) මෑත කාලයේ දී ක්‍රියාත්මකවන පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන හේතුවෙන් ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය හා වගා කරන ඉඩම් ප්‍රමාණය ද ඉහළ යමින් පවතී.

(I) (a) ශ්‍රී ලංකාවේ වී වගා කිරීම සඳහා පවතින විභවය පිළිබඳ කරුණු දෙකක් සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ වගා කරන වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදයක යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(II) (a) වී වගාවට හානි කරන කෘමි නොවන සතුන් දෙදෙනෙකු නම් කර, ඒ ඉදිරියෙන් ඔවුන්ගේ හානිය ද සඳහන් කරන්න.

(b) වී වගා කරන ක්ෂේත්‍රයක ඇති විය හැකි පහත සඳහන් වල් පැළෑටිවලට උදාහරණය බැගින් දක්වන්න.

- පන්
- පළල් පත්‍ර (ලකුණු 03)

(III) වී බීජ ක්ෂේත්‍ර සංස්ථාපනයෙන් පසු සිදු කෙරෙන පශ්චාත් සාත්තු සඳහන් කරන්න. (ලකුණු 04)

(05) කෘෂිකර්මාන්තයේ දියුණුවත් සමඟ බෝග වගාවට අවශ්‍ය විවිධ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ලිංගික ප්‍රචාරණයට අමතරව වර්ධක ප්‍රචාරණ ක්‍රම ද ඵලදායිව භාවිත කරනු ලැබේ.

(I) (a) බීජ ප්‍රරෝහනයට අවශ්‍ය සාධක දෙකක් නම් කරන්න.

(b) බීජ සිටුවීමට පෙර සිදුකරනු ලබන බීජ ප්‍රතිකාර ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(II) (a) අඹ සඳහා අංකුර බද්ධයක් සිදු කිරීමේ දී ග්‍රාහකය හා අනුජය ලෙස තෝරා ගැනීමට සුදුසු අඹ ප්‍රභේදයක් බැගින් සඳහන් කරන්න.

(b) ශාකයක් බද්ධ කිරීමෙන් පසු සිදු කළ යුතු වැදගත් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(III) පටක රෝපණය මගින් ශාක ප්‍රචාරණයේ වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(06) මානව පෝෂණයේ දී මිනිසාගේ කායික, මානසික යහපැවැත්ම තහවුරු වන පරිදි ආහාර තේරීම හා සැකසීම සඳහා, පෝෂණය පිළිබඳ දැනුම ඉතා වැදගත් වේ.

(I) (a) ප්‍රෝටීන් ලබාගත හැකි ශාකමය ආහාරයක් හා සත්ත්වමය ආහාරයක් බැගින් ලියන්න.

(b) ප්‍රෝටීන අඩංගු ආහාර ලබා ගැනීම වැදගත්වන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 03)

(II) (a) පහත සඳහන් ආහාර නරක් වූ විට නිරීක්ෂණය කළ හැකි ලක්ෂණයක් බැගින් ලියන්න

1. කිරි 2. මස් 3. මාලු 4.බිත්තර

(b) ශ්‍රී ලංකාවේ ජනතාව අතර නීරක්තිය යන රෝගි තත්ත්වය බහුලවීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(III) (a) අතිරික්ත අඹ අස්වැන්න පරිරක්ෂණය කළ හැකි ආකාර දෙකක් ලියන්න.

(b) ආහාරයක් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දි එම ආහාරයේ, " අගය වැඩි කිරීම" නිසා ඇති වන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(07) වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ සත්ත්ව නිශ්පාදනය හා ඒක පුද්ගල සත්ත්ව ප්‍රෝටීන පරිභෝජනය වැඩි වීම තුළින් සත්ත්ව පාලන අංශය ක්‍රමයෙන් සංවර්ධනය වෙමින් පවතින බව පෙන්නුම් කෙරේ.

(I) (a) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය සඳහා ඇති කරන යුරෝපීය එළ ගව වර්ග දෙකක් සඳහන් කරන්න.

(b) ඉන්දීය ගව වර්ග පෙන්නුම් කරන විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(II) (a) සත්ත්ව ආහාර සලාක පිළියෙළ කිරීමේ දී, පහත සඳහන් පෝෂක ලබාගත හැකි සත්ත්ව ආහාරය බැගින් නම් කරන්න.

1. කාබෝහයිඩ්‍රේට 2. ඛනිජ

(b) ගව දෙනුන් කෘත්‍රිම සිංචනය කිරීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(III) ශ්‍රී ලංකාවේ ඉඩ සීමිත, අර්ධ නාගරික ප්‍රදේශයක කුකුළන් ඇති කිරීම සඳහා වඩා සුදුසු ක්‍රමයක් නම් කර , එම ක්‍රමයේ වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 04)